# සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි

# අතුරු වෛද්‍ය සේවයය අයත්

# (MT – 04)

# මහජන සෞඛ්‍ය රසායනාගාර

# ශිල්පි තනතුර

# සඳහා වන බඳවා ගැනීමේ

# පරිපාටිය

දුරකථන
தொலைபேசி
Telephones
011-2136600
011-2136650

ලේකම්
செயலாளர்
Secretary
011-2136602

ෆැක්ස්
தொலைநகல்
Fax
011-2876169
011-2876181

විද්‍යුත් තැපැල
மின் - அஞ்சல்
E-mail
info@psc.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
Website
www.psc.gov.lk

අධ්‍යක්ෂ (පරිපාලන - ...)
27 NOV 2020
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය ... අමාත්‍යාංශය, කොළඹ 10

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No. PSC/EST/06-01-13/02/2018

ඔබේ අංකය / உமது இல. / Your No. TA/1B/13/2014-I වෙළුම

දිනය / திகதி / Date 2020.11. 03

10 NOV 2020

11 NOV 2020

SECRETARY ★ Ministry of Health & Indigenous Medicine
10 NOV 2020
28081

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

<u>අතුරු වෛද්‍ය සේවයට අයත් MT-04 තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කර ගැනීම</u>
<u>මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ සමාංක හා 2020.10.14 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.10.28 දින සහතික කරන ලද, මෙම කොමිෂන් සභාවේ ලේකම්ගේ අත්සනින් යුත් මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ මුල් පිටපත මේ සමග එවමි.

03. මෙ පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, අදාළ බඳවා ගැනීමේ පටිපාටිය ඔබ අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරන ලෙසත් කාරුණිකව දන්වමි.

D(A-E)

DDG A3

11/12

ආර්.ඩී.පී.එස්. ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙනුවට

පිටපත්

1. ලේකම්, ජාතික වැටුප් කොමිෂන් සභාව - මුල් පිටපත මේ සමඟ එවමි.
2. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - මුල් පිටපත මේ සමඟ එවමි.

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි අතුරු වෛද්‍ය සේවා ගණයේ (MT-04 ) මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය**

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: අදාල නොවේ.

1.2 අමාත්‍යාංශය: සෞඛ්‍ය අමාත්‍යාංශය

| | |
|---|---|
| යොමු අංකය: TA/1B/13/2014 | දිනය : 2018.03.11 |

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:

| | |
|---|---|
| යොමු අංකය: DMS/0054 | දිනය : 2013.12.31 |
| යොමු අංකය: DMS/0054 /PPSM | දිනය : 2014.04.01 |
| යොමු අංකය: DMS/D5/95/24/16/Vol-I | දිනය : 2014.01.09 |
| යොමු අංකය: DMS/0054/PPMS | දිනය : 2014.08.26 |
| යොමු අංකය: DMS/0067/Cadre | දිනය : 2015.03.17 |
| යොමු අංකය: DMS/0016/0033 | දිනය : 2016.04.05 |
| යොමු අංකය: DMS/0016/099 | දිනය : 2016.04.06 |
| යොමු අංකය: DMS/0016/016 | දිනය : 2016.05.10 |
| යොමු අංකය: DMS/0016/061 | දිනය : 2016.05.30 |
| යොමු අංකය: DMS/0016/003 | දිනය : 2016.06.06 |
| යොමු අංකය: DMS/0016/PMS/2018 | දිනය : 2018.06.21 |

1.4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

| | |
|---|---|
| යොමු අංකය:EST-2/02/REC/0919 | දිනය : 2018.01.30 |

1.5. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:

| | |
|---|---|
| යොමු අංකය :NSCC/4/13/SR/17 | දිනය : 2018.01.19 |

1.6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

| | |
|---|---|
| යොමු අංකය:PSC/EST/06-01-13/02/2018 | දිනය : 2018.09.25 |
| පළමු සංශෝධනය PSC/EST/06-01-13/02/2018 | දිනය : 2019.11.19 |

02. පත් කිරීම් බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1. සේවා ගණය : අතුරු වෛද්‍ය සේවා – ඛණ්ඩ 03

3.2. ශ්‍රේණි : III, II, I , අධිශ්‍රේණිය

3.3. පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

සෞඛ්‍ය ආරක්ෂණ වෘත්තීය කාර්යයන් ඉටු කරන්නා වූ මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුරුට අදාල විද්‍යාත්මක මූලධර්ම පදනම්ව තාක්ෂණ විද්‍යාත්මක කාර්යයන් ඉටු කිරීමෙන් රෝග විනිශ්චය, රෝග නිවාරණය, රෝග වැලැක්වීම හා ප්‍රතිකාර කිරීම සඳහා එනම්, රෝගී සත්කාර සේවාව පරිපූර්ණ වීමට ඉවහල් වන්නාවූ වෛද්‍ය නිගමනයන් තහවුරු කිරීම සඳහා රසායනාගාර පරීක්ෂණ සිදු කිරීම, ආචාර්යවරයකු වශයෙන් තනතුරට අදාල සියළු විෂයන්ට

අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම සහ ඊට අනුශාංගික වන්නාවූ සුවිශේෂිතව පවරනු ලබන කාර්යයන්ද මෙම වෘත්තියට අයත් වේ.

3.4. කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

සටහන - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු ය.

05. වැටුප්

5.1. වැටුප් කේත අංකය : MT 4 - 2016

5.2. වැටුප් පරිමාණය :

රු. 31,190 - 10 × 445 - 11 × 660 - 10 × 730 - 10 × 750 - රු.57,700

5.3. ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය |
|---|---|---|
| III | පියවර 01 | රු. 31,190/= |
| II | පියවර 12 | රු. 36,300/= |
| I | පියවර 23 | රු. 43,630/= |
| අධි ශ්‍රේණිය | පියවර 32 | රු. 50,200/= |

සටහන :- පුහුණු කාලය තුළදී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව දීමනාවක් ගෙවනු ඇත. (රජය විසින් කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව මෙම දීමනා වෙනස් විය හැක.)

06. සේවා ගණයට අයත් තනතුරු

6.1. අනුමත තනතුරු නාමය, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් -(ඇමුණුම - 01)

6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

| අනුමත තනතුරු නාමය | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | 116 | III, II, I, සහ අධි ශ්‍රේණිය | ඇමුණුම 01 |
| ආචාර්ය (මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී පුහුණු පාසල) | 02 | I ශ්‍රේණිය | |

"ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා අධි ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සලකනු ලැබේ."

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1. බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2. විවෘත බඳවා ගැනීම

7.2.1.බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2.සුදුසුකම් :

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :

| අනු අංකය | තනතුර | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 01. | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | සිංහල භාෂාව/දෙමළ භාෂාව ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයන් හයකින් අ.පො.ස.(සා.පෙ.) සමත්වීම.<br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව,රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතරින් දෙකක් එකවරකදී සමත්වීම. |

7.2.2.2. වෘත්තීය සුදුසුකම් : සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී වසර 1 1/4 ක වෘත්තීමය පූර්ණකාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම

7.2.2.3. පළපුරුද්ද : අදාල නොවේ

7.2.2.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5. වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

7.2.3. වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18
7.2.3.2 උපරිම වයස් සීමාව : අවුරුදු 30

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) පුහුණුවට බඳවා ගැනීම

පුහුණුව සඳහා බඳවා ගනු ලබන සංඛ්‍යාව,සලකා බලනු ලබන වර්ෂයේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවට හා එක් එක් පළාත අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමානුපාතිකව ඉහලම Z අගය ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

වර්ෂ දෙකක හෝ ඊට වැඩි වර්ෂ ගණනක ප්‍රතිඵල මත පුහුණුව සඳහා බඳවා ගනු ලබන්නේ නම්,සලකා බලනු ලබන වර්ෂවල සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවට හා එක් එක් පළාත අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා ඉහලම Z අගය ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

සටහන -

1. අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත පුහුණුව සඳහා අයදුම්පත් කැඳවන වර්ෂයන් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

2. රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් පුහුණුව සඳහා සිසු නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

3. පුහුණුවට බඳවා ගනු ලබන සිසුන් සංඛ්‍යාව අනුව ඉහළම Z අගය ලබාගන්නා අයදුම්කරුවන්ගෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයකට කැඳවනු ලබන අතර ඔවුන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් එම සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ. ( සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නො ලැබේ)

පුහුණුවට බඳවා ගැනීමට අදාල කොන්දේසි

- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය. තමන් අයදුම් කරන පළාත තුල සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු දිනට පූර්වාසන්න අවුරුදු තුනක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය.

- පුහුණුවට බඳවා ගනු ලබන දිනට විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතු ය.

- පුහුණුව සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතු ය.

(ආ) III වන ශ්‍රේණියට බඳවා ගැනීම

ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන සිසු නිලධාරීන්ගේ කුසලතා අනුපිළිවෙල, පුහුණුවට බඳවා ගැනීමේදී සලකා බලනු ලැබූ පළාත හා තනතුරෙහි පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.3 යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ

7.2.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබා දෙනු නොලැබේ.)

7.2.4.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

7.2.4.4.2 ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3. සීමිත බඳවා ගැනීම : අදාල නොවේ

7.4. කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාල නොවේ

8. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත / වාචික සහ ප්‍රායෝගික පරීක්ෂණයකි |

| | | |
|---|---|---|
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |

(එක් එක් කාර්යක්ෂමතා කඩඉම් වලට අදාල විෂය නිර්දේශයන් ඇමුණුම 2 -I, 2-II, 2-III හි සඳහන් වේ.)

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද ? වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද :

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හෝ ලේකම් විසින් අනුමත කරන ලද ආයතනයක් විසින්

2. (අ) කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| එක් එක් බඳවා ගැනීම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් | |
|---|---|
| පැරණි බඳවාගැනීම් පරිපාටිය | නව බඳවාගැනීම් පරිපාටිය |
| (1), I කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>• විෂය ක්ෂේත්‍රයට අදාල (ලිඛිත, වාචික, ප්‍රායෝගික)<br>• ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි | (1). I කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි |
| (2). II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්න පත්‍රය →<br>• කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි } | (2). II කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ලිඛිත, වාචික, ප්‍රායෝගික)<br>• ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි |
| | (3). III කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) |

(ආ). පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩයිමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විෂයයන් සමත් නිලධාරීන් මෙම බඳවාගැනීම් පරිපාටිය අනුව පළමු

කාර්යක්ෂමතා කඩයිමේ සමත් විෂයන් සඳහා පමණක් නිදහස් කරනු ලැබේ. පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව විෂය ක්ෂේත්‍රයට අදාල පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති නිලධාරීන් මෙම බඳවා ගැනිම් පරිපාටිය බලාත්මක දිනට විෂයානුබද්ධ පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ). පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩයිමෙහි ආයතන සංග්‍රහය හෝ මුදල් රෙගුලාසි යන විෂයයන් දෙකෙන් එක් විෂයක් සමත්ව ඇත්නම් එම විෂය සමත් නිලධාරීන් සමත් වි ඇති විෂය පමණක් නව බඳවා ගැනීමේ පරිපාටිය අනුව සමත්විමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඈ) මෙම බඳවා ගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති බඳවා ගැනිම් පරිපාටිවල විධිවිධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයෙන් සමත් විය යුතු නිලධාරීන්, පැවති බඳවා ගැනිම් පරිපාටියට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ එක් එක් විෂයයන්ට අනුරූපී වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ විෂයයන් සමත් විමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල යුතුය. අනුරූපී විෂයයන් ඉහත සඳහන් වගුවෙහි දැක්වේ. පැරණි බඳවා ගැනීම් පටිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයෙන් අනුරූපී විෂයන් සමත්වි ඇත්නම් එම විෂයන් පමණක් නව බඳවා ගැනිම් පර්පාටිය යටතේ සමත්විමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ) නව බඳවාගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට I ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා තුන් වන කාර්යක්ෂමතා කඩයිම සමත්විමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඊ) මෙහි උපඡේද අංක (ඈ) හි සඳහන් පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය වෙනස් වුව ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයට අදාල කාලසීමාව වෙනස් නොවේ.

(උ) නිදහස් කිරිම

ආචාර්ය තනතුරෙහි සේවය කරන නිලධාරීන් ජාතික සෞඛ්‍ය විද්‍යාතනය විසින් පවත්වනු ලබන ඉගැන්විම් පිළිබඳ මාස 06ක පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කර තිබීම හෝ තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන මාස 06කට නොඅඩු ඉගැන්විම පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබේ නම් III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

09. භාෂා ප්‍රවිණතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවිණතාව |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවිණතාවය පරිවාස කාලය තුලදී ලබාගත යුතුය. |
| 02 අනෙක් රාජ්‍ය භාෂාව | රා.පරි. චක්‍රලේඛ 1/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ ප්‍රවිණතාවය ලබා ගත යුතුය. |

10. ශ්‍රේණි උසස් කිරීම් :

10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1 .1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.1 .1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම ස්ථිර කර තිබීම
ii. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයාගෙන තිබීම
iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05)ක් තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම
vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම

10.1 .1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයාගෙන තිබීම
ii. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

10.3 I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම

10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහයක් (10 ක්) උපයාගෙන තිබීම

ii. අනුමත කාර්යසාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වී තිබීම

10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූවිට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය

සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතු ය.

11. තනතුරුවලට පත් කිරීම

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරා ගනු ලබන ආකාරය |
|---|---|---|
| ආචාර්ය මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී පුහුණු පාසල | (i). අදාල තනතුරෙහි ස්ථිර කරන ලද නිලධාරියෙකු විය යුතුය.<br><br>(ii). අදාල තනතුරේ II ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම සමත් II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහල නිලධාරියෙකු විය යුතුය.<br><br>(iii) අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර පහක (5) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | ආචාර්ය තනතුර සඳහා තෝරා ගනු ලබන ආකාරය<br><br>අභ්‍යන්තර චක්‍රලේඛ මගින් /රජයේ ගැසට් පත්‍රයේ /ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරික්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්‍ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.<br><br>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයේ ලකුණු දීමේ ක්‍රමය<br><br>ලකුණු ලබාදෙන නිර්ණායකයන් — උපරිම ලකුණු ප්‍රමාණය<br><br>අමතර සේවා පලපුරුද්ද 40<br>ඉගැන්වීමේ පලපුරුද්ද 10<br>අමතර අධ්‍යාපන සුදුසුකම් 20<br>විශේෂ කුසලතාවයන් 10<br>ඉංග්‍රිසි භාෂා ප්‍රවීණතාවය 15<br>සම්මුඛ පරීක්‍ෂණයේදි දක්වන කුසලතාවය 05<br>මුළු ලකුණු 100<br><br>ප්‍රායෝගික පරීක්‍ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය<br><br>ලකුණු ලබාදෙන නිර්ණායකයන් — උපරිම ලකුණු ප්‍රමාණය<br><br>අරමුණ හා ප්‍රවිෂ්ඨවීම 5<br>පෞරුෂය හා හඬ පාලනය 5<br>සන්නිවේදනයේ පැහැදිලි බව 5<br>කාල කළමනාකරණය 5<br>ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය 5<br>මුළු ලකුණු 25<br><br>සටහන -<br><br>1. ඉහත වගුවල දැක්වෙන ලකුණු ලබාදෙන නිර්ණායකයන් සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයක් ඇතුලත, එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණය සහ ප්‍රායෝගික පරීක්‍ෂණය සඳහා සවිස්තරාත්මක ලකුණු පරිපාටිය, අයදුම්පත් කැඳවීමේ නිවේදනය අනුමත කරනු ලබන අවස්ථාවේදි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | | 2. පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් (05) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.<br><br>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් ආචාර්ය තනතුර සඳහා පත් කරනු ලැබේ. |

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවු කොන්දේසි : අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුලත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය (බඳවා ගැනීමේ පරිපාටිය ) ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුවූවන් සඳහා

නව බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT–04 2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී නිලධාරීන් ප්‍රතිසංවිධිත අතුරු වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහනය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධි විධාන වලට යටත්ව පහත පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේ වතුදු අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරියාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද නොකල යුතුය.

සේවයේ II " ආ " ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ III වැනි ශ්‍රේණියට

සේවයේ II " අ " ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ II වැනි ශ්‍රේණියට

සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ I වැනි ශ්‍රේණියට

සේවයේ I ශ්‍රේණියේ වසර දහය (10)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ I ශ්‍රේණියට අදාල වැටුප් වර්ධක දහය (10)ක් උපයාගෙන ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට

අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

17. අන්තර්කාලීන විධිවිධාන

සටහන - මෙම බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් විධිවිධාන 2016.01.01 දින සිට බලාත්මක වේ.
17.1 ශ්‍රේණි උසස් කිරීම් සම්බන්ධ විධිවිධාන

වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන්ගේ සේවයේ හා අතුරු වෛද්‍ය සේවයේ I වන ශ්‍රේණියේ උසස්වීම් ලබා දීම යන මැයෙන් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2012.03.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014.09.04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹ ඇති තීරණය අනුව 2010.11.01 දින සිට 2015.12.31 දින දක්වා අන්තර් කාලය ක්‍රියාත්මක වේ. මෙම අන්තර් කාලය තුළ II ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ උසස්වීම් පහත පරිදි ලබා දෙනු ඇත.

17.1.1 II අ ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස් කිරීම

පුහුණු කාලයද ඇතුළුව II "ආ" ඛණ්ඩයේ / III ශ්‍රේණියේ වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් II "අ" ඛණ්ඩයට / II ශ්‍රේණියට උසස් කරනු ඇත.

17.1.2 I ශ්‍රේණියට උසස් කිරීම

II "අ" ඛණ්ඩයේ / II ශ්‍රේණියේ වසර 09 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් හිඟ වැටුප්, අතිකාල දීමනා හා අනෙකුත් දීමනා ගෙවීමකින් තොරව අදාළ සේවයේ I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

සකස් කළේ :

අත්සන :- ..................................................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

සී. ඩිලක්ෂන්
වැ.බ. අධ්‍යක්ෂ (පරිපාලන - ආයතනික)
නම :- සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
තනතුර :- 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
දිනය :- ..................................................

පරීක්ෂා කළේ :

අත්සන :- ..................................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

වසන්ති ගුණසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
නම :- ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය
තනතුර :- "සුවසිරිපාය"
කොළඹ 10.
දිනය :- 2020/9/27

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :- ..................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

විශේෂඥ වෛද්‍ය එස්. ශ්‍රීධරන්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරි ආ...)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385 ... විමලවංශ හිමි මා...
කොළඹ 10.

නම :- ..........................................................

තනතුර :- ..........................................................

දිනය :- .................................................. නිල මුද්‍රාව :- ------------------------------------------

යොමු අංකය: TA/1B/13/2014

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුර සඳහා 2018.09.25 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන :- ..........................................................

නම :- ..........................................................

ලේකම්,

සෞඛ්‍ය අමාත්‍යාංශය

වෛද්‍ය එස්. එච්. මුණසිංහ
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය :- 2020/10/14 .................. නිල මුද්‍රාව :-

යොමු අංකය: PSC/EST/06-01-13/02/2018

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ................ හි සෞඛ්‍ය රසායනාගාර ශිල්පී තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2018.09.25 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන :- ..........................................................

නම :- එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9. රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

දිනය :- 2020.10.28 .................. නිල මුද්‍රාව :-

ඇමුණුම -01

සේවා ගණයට අයත් තනතුර/තනතුරු

අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී | 116 | III සහ II ශ්‍රේණිය | (අ). සියලුම ආදර්ශ නියම කොට ඇති ආකාරයට වර්ණ ගැන්වීම, පරීක්ෂා කිරීම, ව්‍යාධිකාරකයින් හඳුනා ගැනීම සහ අදාල ව්‍යාපාරය හෝ වැඩ සටහන හෝ වෛද්‍යවරයා ඉල්ලා ඇති ආකාරයට වාර්තා සැපයීම.<br><br>භාවිතා කරනු ලබන සියලුම රසායනික ද්‍රව්‍ය සහ උපකරණ ඇණවුම් කිරීම, ලබා ගැනීම, ගබඩා කිරීම, නිකුත් කිරීම සහ ඒවා පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම.<br><br>බීජානුහරණය පිළිබඳ පිළිපැදිය යුතු සියලු පියවර ගනිමින් අවශ්‍ය වූ විටක තැවරුම් පිළියෙල කිරීම.<br><br>ආදර්ශ භාර ගැනීම සහ නියම ලෙස අදාල ස්ථානවලට යැවීම (ක්ෂේත්‍රයේදී එකතු කරනු ලබන ද්‍රව්‍ය භාර ගැනීම සහ ක්ෂේත්‍රයේ සිට එවනු ලබන උපකරණ භාර ගැනීම සහ නැවත ක්ෂේත්‍රයට යැවීමද ඇතුළුව) අදාල වර්ණකාරක, ප්‍රතිකාරක සහ සාන්ද්‍ර ද්‍රාවණ පිළියෙල කිරීම සහ ගබඩා කිරීම, ආදර්ශ රැස් කිරීම සඳහා භාවිතා කරනු ලබන සියලුම උපකරණ නියමාකාරයෙන් බීජානුහරණය කරනු ලබන බවට වගබලා ගැනීම,පාවිච්චි කරන ලද කදාවන් නැවත පාවිච්චිය සඳහා නියම කොට ඇති අන්දමට පිරිසිදු කොට සකස් කිරීම, අධීක්ෂණය කිරීම,අදාල උපකරණ සියල්ල පිරිසිදු කිරීම පිළිබඳව වගකීම හා සියලුම උපකරණ නඩත්තු කිරීම හා ඒවායෙහි සුරක්ෂිතභාවය පිළිබඳ වගකීම, දෛනික කාර්යසාධන වාර්තා පවත්වාගෙන යාම. |
| | | ------ | ------------------------------ |
| | | I ශ්‍රේණිය හා අධි ශ්‍රේණිය | (ආ). ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව ඉහත නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, පුහුණු සිසුන් අධීක්ෂණය, විභාග සඳහා දායකත්වය ලබාදීම හා අවශ්‍ය විටදී අංශ පරිපාලනය පිළිබඳව වගකීම දැරීම. |

| | | | |
|---|---|---|---|
| ආචාර්ය මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී පුහුණු පාසල | 02 | I ශ්‍රේණිය | මහජන සෞඛ්‍ය රසායනාගාර ශිල්පී ශිෂ්‍ය ලියාපදිංචිය, පුහුණු කිරීම, දේශන පැවැත්වීම, ප්‍රශ්න හා ප්‍රශ්න පත්‍ර සැකසීම, උත්තර පත්‍ර පරීක්ෂාව, විභාග පැවැත්වීම සඳහා සහයෝගය ලබාදීම, ප්‍රායෝගික පුහුණුව අධීක්ෂණය, සේවාස්ථ පුහුණු පැවැත්වීම,අවශ්‍ය අවස්ථාවලදී තාක්ෂණික කාර්යයන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග මණ්ඩල නියෝජනය,පුහුණු පාසල් තුළ විනය පවත්වාගෙන යාම, පුහුණු පාසල්වල අවශ්‍යතා පිළිබඳව ජ්‍යෙෂ්ඨ ආචාර්ය වෙත වගකීම,තනතුරට අදාල වෙනත් රාජකාරි කටයුතු කිරීම. |

සකස් කලේ :

අත්සන :.....................................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

සී. ඩිලක්ෂන්
නම :- වැ.බ. අධ්‍යක්ෂ (පරිපාලන - ආයතනික)
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
තනතුර :- "සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
දිනය :- කොළඹ 10.

පරීක්ෂා කලේ :

අත්සන :.....................................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

වසන්ති ගුණසේකර
නම නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
ලේකම් වෙනුවට
තනතුර :- සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.
දිනය :- 2020/[illegible]

අත්සන :.....................................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- විශේෂඥ වෛද්‍ය එස්. ශ්‍රීධරන්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරි ආවරණ)
තනතුර :- සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය :- 2020. 09. 28 නිල මුද්‍රාව :-

ඇමුණුම 2

ඇමුණුම 2 - I

අමාත්‍යාංශය : සෞඛ්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : අතුරු වෛද්‍ය සේවය

01. විභාගයේ නම: අතුරු වෛද්‍ය සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | රචනා ප්‍රශ්න 8කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | රචනා ප්‍රශ්න 8කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br><br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br><br>IV, XII, XIII, XIV, XIX, XLVII, XLVIII |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි මත සැකසේ.<br><br>I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම(මුදල් රෙගුලාසි 1 සිට 68 දක්වා)<br><br>III වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරී, ගණක නිල ආදායම් ගිණුම්නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබාදීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම<br>මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා) |

සකස් කළේ :

අත්සන :- ..............................................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

සී. ඩිලක්ෂන්

නම :- වැ.බ. අධ්‍යක්ෂ (පරිපාලන - ආයතනික)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
තනතුර :- "සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
දිනය :- ..............................................

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

වසන්ති ගුණසේකර

නම :- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
ලේකම් වෙනුවට
තනතුර :- සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.
දිනය :- 2020.7.27

අත්සන :- ..............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- විශේෂඥ වෛද්‍ය එස්. ශ්‍රී...
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරි ...)
තනතුර :- සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය :- 2016.05.20

නිල මුද්‍රාව :-

ඇමුණුම 2- II

අමාත්‍යාංශය : සෞඛ්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : අතුරු වෛද්‍ය සේවය

01. විභාගයේ නම: අතුරු වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

(අ). කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | රචනා ප්‍රශ්න 7කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 4කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 2 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | රචනා ප්‍රශ්න 7කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 4කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 2 | 100 | 40% |

(ආ). දෙපාර්තමේන්තු පරීක්ෂණය:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ආකාරය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ ලිඛිත | රචනා ප්‍රශ්න 8කින් සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 5කට පිළිතුරු සැපයිය යුතුය. | පැය 3 | 100 | 40% |
| විෂයානුබද්ධ වාචික | විෂය ක්ෂෙත්‍රය ඇසුරින් සහ රාජකාරියේ දී මුහුණපාන ගැටළු පිළිබඳව වාචිකව කරනු ලබන පරීක්ෂණයකි. | විනාඩි 15 | 100 | 40% |
| විෂයානුබද්ධ ප්‍රායෝගික | විෂය ක්ෂෙත්‍රය ඇසුරින් ප්‍රායෝගිකව කරනු ලබන පරීක්ෂණය | පරීක්ෂණය අනුව | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍රය සැකසේ.<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br>XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII |
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>(I). VI වන පරිච්ඡේදය -<br>ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම්<br>(මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා)<br><br>(2). XIII වන පරිච්ඡේදය -<br>සැපයුම් වැඩ හා සේවා සැපයීම් මිළට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරවීම<br>(මුදල් රෙගුලාසි 708 සිට 775 දක්වා) |
| විෂයානුබද්ධ පරීක්ෂණය -<br>ලිඛිත විභාගය | 1. මැලේරියා, බරවා, ශ්වසන රෝග, ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස්, ලාදුරු යන විෂය ක්ෂේත්‍ර<br>2. රසායනාගාර කළමනාකාරිත්වය |
| විෂයානුබද්ධ පරීක්ෂණය වාචික පරීක්ෂණය | විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රය අදාල විෂය නිර්දේශයට අදාලව හා සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරීක්ෂණයකි. |
| විෂයානුබද්ධ පරීක්ෂණය ප්‍රායෝගික පරීක්ෂණය | විෂය ක්ෂේත්‍රයට අදාලව හැකියාවන්, ක්‍රියාකාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාල වන විෂය නිර්දේශය මෙයටද අදාල වේ. |

සකස් කලේ :

අත්සන :- ..............................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

සී. ඩිලක්ෂන්
වැ.බ. අධ්‍යක්ෂ (පරිපාලන - ආයතනික)
නම :- සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
තනතුර :- 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
දිනය :- ..............................................

පරීක්ෂා කලේ :

අත්සන :- ..............................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

වසන්ති ගුණසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
නම :- ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය
තනතුර :- "සුවසිරිපාය"
කොළඹ 10.
දිනය :- 2020 / 9 / 27

අත්සන ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- ..........................................

තනතුර :- විශේෂඥ වෛද්‍ය එස්. ශ්‍රීධරන්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරි ආවරණ)
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"

දිනය :- 2020.05.28

නිල මුද්‍රාව :- 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

ඇමුණුම 2- III

අමාත්‍යාංශය : සෞඛ්‍ය අමාත්‍යාංශය

සේවා ගණය : අතුරු වෛද්‍ය සේවය

01. විභාගයේ නම: අතුරු වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ප්‍රමාණය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) | ප්‍රශ්න 8න් 5කට පිළිතුරු සැපයිය යුතුය | පැය 3 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා : සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) | 1. මැලේරියා, බරවා, ශ්වසන රෝග, ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස්, ලාදුරු යන විෂය ක්ෂේත්‍ර<br>2. රසායනාගාර කළමනාකාරිත්වය |

සකස් කලේ :

අත්සන :- ..........................................................
(විෂය භාර කනිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

සී. ඩිලක්ෂන්
නම වැ.බ. අධ්‍යක්ෂ (පරිපාලන - ආයතනික) ..........
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
තනතුර :- ..............."සුවසිරිපාය"..............................
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.
දිනය :- ..........................................................

පරීක්ෂා කලේ :

අත්සන :- ..........................................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

වසන්ති ගුණසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන) III
නම :- ..........ලේකම් මෙහුවර..............
සෞඛ්‍ය අමාත්‍යාංශය
තනතුර :- ..............."සුවසිරිපාය"..................
කොළඹ 10.
දිනය :- ...2020/10/27...............

අත්සන :- ..........................................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- ..........................................................
විශේෂඥ වෛද්‍ය එස්. ශ්‍රීධරන්
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (රාජකාරි ආවරණ)
තනතුර :- ..........................................................
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
නිල මුද්‍රාව :- 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය :- ...2020.09.28...........................